# නාමික නිදහසන් එහා

## ආනන්ද ගාල්ලගේ සිඩ්නි නගරයේ සිට

අප මවබිම මහා බ්‍රිතාන්‍යයෙන් නාමික නිදහස ලබා වසර 71ක් ගතවී ඇත . බ්‍රිතාන්‍ය පාලකයින්ගෙන් අපරටේ පාලකයින් පාලන බලය ලබා කරන ලද දේවල් කිහිපය ක් සමාලෝචනය කිරීමට අදහස් කරමි. 1948 පෙබරවාරි 04 ලබාගත් නිදහස් දිනය මට මතක නැත්තේ මා උපන්නේ 50 දශකයේ වීම නිසාය. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් හැටියට තිබු කාලයේ මෙන්ම අප කුඩා කාලයේ ද අප රටේ සුලබව දක්නට ලැබුනේ එංගලන්තයේ නිෂ්පාදනය කරනලද බඩු බාහිරාදීයයි . උදාහරණයක් හැටියට කියතොත් singar මහන මැසීම Raleigh "Humber බෛසිකලය , Austin "Ford "Morris මෝටර් රථ , සෙල්ලම් බඩු Toffee ,චොකලට් , රැජිණගේ මුහුනු ලාංචනය යොදා සෑදූ රට උලු කැට මේ නිෂ්පාදන අතරින් අතලොස්සකි 1971 කැරැල්ල ඇතිවන විට යොවුන් වියේ සිටි අපට එතෙක් රටේ කලබලකාරි වාතාවරනයක් අත් දැකීමට නොලැබුනි . රට කොතරම් සාමකාමී වුවාද කියතොත් ත්‍රිවිද හමුදාව ඉදිරියට ආවේ නිදහස් උත්සව වැනි විශේෂ අවස්ථාවල පමණි. ඒ කාලයේ මේ කැරැපදබස්ක හමුදා සුදු අලින් ලෙස සලකා නිෂ්ප්‍රබා කර දැමීමටද යෝජනා තිබුන බවද මතකය. රටේ කොතැනකවත් වර්ගවාදී , ආගම්වාදි ගැටුම් නොතිබුණි .දේශපාලනයට පැමිණියේ බොහොමයක්ම නීතිවේදින් වූ අතර ඒ ඒ ආසනවල සිටි ප්‍රබූවරුද දේශපාලන පක්ෂ වලට බෙදී ජයලබා මන්ත්‍රීවරු ,ඇමතිවරු වුහ .

60, දශකයේ මැද භාගයෙන් පසු රැකියා දීමේදී බලයේ සිටි අය තම පාක්ෂිකයින්ට පමණක් රැකියා දීම ආරම්බවුනි. මේ නිසා තම හිතවත් දේශපාලන පක්ෂවලට හේත්තුවී රැකියා, නිලතල ලබාගැනීමට චන්දදායකයින් පුරුදුවිය. මේ පක්ෂ දේශපාලනය කොතරම් අහිතකරවූවාද කියතොත් චන්දයක් අවසානයේ පරාජයට පත්වූ පක්ෂවල චන්දදයකයිනට ශාරීරික ,මානසික හිරිහැර මෙන්ම දේපළ හානි කිරීම දක්වා දුරදිග ගියේය. තවදුරටත් පාලනපක්ෂයට පැමිණි අය සුදුස්සන්ට රැකියාදීම පසෙක තබා අසාමාන්‍ය ලෙස නුසුදුස්සන් තම බල අධිකාරී වලට ඇතුල් කිරීම දිගටම කෙරුණි. විශේෂයෙන්ම ලංගම,වරාය හා තව සංස්ථා බොහෝමයකටම අතිරික්ත ලෙස සේවකයින් බවා ගැනුණි.

1970 රාජ්‍ය බලයට පත් ශ්‍රී.ල.නි.ප සිරිමාවෝ බන්ඩාරනායක මහත්මිය රට සංවර්දනයට කියා පිටරටින් ගෙන්වූ සියල්ලම පාහේ සීමා කළාය. ශ්‍රීලංකාව කෘෂිකාර්මික රටක් හෙයින් රටේ වැවීමට හැකිදේ වැවීමට උදව් දී රටේ නිෂ්පාදනය කිරීමට නොහැකිදේ ආනයනය කිරීමට කටයුතු කල හැකිව තිබුණි. මේ තහංචි නිසා සාමාන්‍ය මහජනයා මහා පරිමානයේ අපහසුකම් වලට පත්විය. හො පැත්තක් ලෙස අල,බතල පරිබෝජනයට මහජනයා උනන්දුවිය. ඇය කළ බරපතල වරදක් නම් වසර 5 කට පාලන බලය ලබා ඉන් අනතුරුව තව වැඩිපුර 2 වසරක් පාලන බලයේ සිටීමය. මෙලෙස 1970-1977 දක්වා වසර 7 ක් බලයේ සිටීමේ ක්‍රියාවලිය ආවුදයක් කරගත් එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර් ජයවර්ධන මහත්මා එතෙක් ආහාර අහේනියකින් පෙළුණු මහ ජනයාට ඇට රාත්තල් 8 ක් දෙනවා යැයි පොරොන්දුවී 1977 මහා මැති වරණයෙන් බලයට පත්විය. ඔහු බලයට පත්වී කරණ ලද ප්‍රදාන වෙනස්කම් කීපයක් නිසා රට ආපස්සට යාම සහ නුසුදුස්සන් පාර්ලිමේන්තුවට යාම වඩා තහවුරු විය. පහත දැක්වෙන වෙනස්කම් ශ්‍රීලංකාව අද දින පවතින මන්දගාමී තත්වයට හේතුවූ බව උගතුන්ගේ මතයවී ඇත.

1. විධායක ජනපති ක්‍රමය හඳුන්වාදීම.
2. විවුර්ත ආර්ථික ක්‍රමය ඇතිකිරීම.
3. පළාත් සභාක්‍රමය හඳුන්වාදීම.
4. චන්දයෙන් පරාජයවූ චන්ද අපේක්ෂකයින්ට චීට් ක්‍රමයට මන්ත්‍රී, ඇමැති පත්වීම් ලබාදීම.
5. වසර 5 ක් පාර්ලිමේන්තුවේ සිටි මන්ත්‍රී වරුනට විශ්‍රාම වැටුප් ලබාදීමට ක්‍රියාකිරීම.

1960 ගණන්වල දකුණු දිග හා ගිනිකොණ දිග ආසියාවේ දියුණුම රටක් හැටියට තිබු ශ්‍රී ලංකාව අද ලෝකයේ නොදියුණුම ගෝත්‍රික රටක් හැටියට පරිවර්තනය වී ඇත. ඒ එසේවුවද අපට සමකාලීනව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ ඉන්දියාව ඊළට ලෝකයේ බලවත්ම රට වෙනු ඇතැයි ඉලක්කකර ඇත.

පසුගිය වසර 71 මෙසේ ගතවු අතර මගේ ප්‍රදාන මාතෘකාවට ප්‍රවේශ වීමටයි දැන් මගේ සුදානම.

මගේ ඕස්ට්‍රලියාවේ නිත්‍ය වාසයට දශක තුනක් පිරෙමින් පවතී.1990 ට පෙර ඕස්ට්‍රලියාවට සංක්‍රමනයවූ ශ්‍රී ලාංකිකයින් හා ඉන්පසු පැමිණි අය අතර එක්තරා වෙනස්කමක් ඇතිබව බොහෝ දෙනාගේ මතයයි. 1990 ට පෙර පැමිණි අය බොහෝ දෙනෙක් ඕස්ට්‍රලියාවේ ජීවන ක්‍රමයට කෙලින්ම අනුගත වූ අතර 1990 න් පසු පැමිණි අය ශ්‍රී ලාංකික ගති පැවතුම් අමතක නොකර ඒවා තමාගේ අවශේස ජන කොටසටද දායාද කර දීමට වැර දරමින් සිටී. මෙයට හේතු වශයෙන් සිංහල භාෂා පන්ති, බෞද්ධාගම ඉගැන්වීමේ පන්ති, බෞද්ධ වෙහෙර විහාර ඉදිකිරීම් බෙහෙවින් හේතු පාදක විය. ශ්‍රී ලංකික කලා කරුවන් ගෙන්වා උත්සව පැවැත්වීම, සිංහල අවුරුදු, වෙසක්,පොසොන් කටින,නත්තල්, දෙදාසේර වැනි දේවල් ද අපේ අය එක්රැස් කරවීමට හේතු පාදක වී ඇත . පෙබරවාරි 4 පවත්වන නිදහස් උත්සවයද ඉන් එකකි.

අප හය හතර නොතේරෙන කාලයේ සිටම එවකට සිටි ප්‍රබුවරුන්, දේශපාලකයින් පෙරදැරිකරගෙන නිදහස් දිනය සැමරුවෙමු. මේ හැම අවස්ථාවකම ගිරවුන් මෙන් ජාතිකගීය ගැයුවෙමු. එදා සිට අද දක්වාම අප අපවම රවට්ටා ගත්තෙමු. ආර්ථික, ආගමික, සමාජයීය වශයෙන් බින්දුවටම බැස ඇති අතර තව දුරටත් අප හා අපගෙන් පැවත එන්නවුන් රවටමුද. කෙලින්ම කියනවානම් බොරුව,වංචාව, දුෂණය ශ්‍රී ලාංකීක ජීවිත වලට කිඳා බැස ඇත. කවුරු බලයට ආවත් මහජනයාට වගතුවක් ජේන තෙක් මානයකවත් නැත. විශේෂයෙන්ම පසුගිය දශක කිහිපය තුල ශ්‍රී ලංකාවේ මෙන්ම පිටරට ජීවත්වන අප එකිනෙකා හමුවෙන අවස්ථාවන්හිදී පොදුවේ එක දෙයක් ගැන කථා කළෙමු. කරමු. එනම්, කවදා අපට අප,අපේරට, ජාතිය , අපේකම ගැන අවංකවම හිතන, පතන, කරන දේශපාලකයෙක් බිහිවේවිද යන්නයි. වාසනාවකට ඒ ප්‍රාර්ථනය ඉටුවේගන එන ලකුණු පහළවී ඇත.

එනම්, මඩ ගොහොරුවේ පිපෙන නෙලුම් මල් දෙකක් මෙන් ජාතියට හිතවත් උගතුන් දෙපලක් ඔබ, අප, රට වෙනුවෙන් ඉදිරියට ඇවිත් සිටී. දැනට අන්තර්ජාලයේ සැරිසරන බොහෝදෙනා දන්නා මේ දෙපල නම් : නාගනන්ද කොඩිතුවක්කු සහ රොහාන් පල්ලෙවත්ත යන මහත්වරුන්ය.

මේ දෙපළ ගැන ඉතා කෙටි හැඳින්වීමක් කරන්නේනම් නගානන්ද මහතා දැනටමත් මෑත අතීතයේ අප රටේ සිදුවූ මහා පරිමාණ යේ අක්‍රමිකතා සියල්ලටම පාහේ තනියෙන්ම ඉදිරිපත්වී මහජනයා වෙනුවෙන් යුක්තිය ඉටුකිරීමට උත්සාහකරන නීතිවේදියෙකි. රොහාන් මහතා ශ්‍රී ලංකාවට විදේශීය විනිමය ගෙනෙන කීර්තිමත් ව්‍යාපාරිකයෙක් වෙන අතර නීතිවෙදියෙක්ද වේ. පිට රටවල් දෙකක ජීවත්වූ මේ දෙදෙනාම ලෝකයේ අනෙකුත් රටවල දේශ පාලන මෙන්ම සමාජ අත්දැකීම් ලැබුවන් වීම විශේෂ අත්දැකීම් ලෙස සැලකිය හැකිය. මේ දෙදෙනාටම පිටරට සිටින රටගැන කැක්කුමක් ඇති ලාංකිකයින්ගේ සහයෝගය ලැබෙන අතර ශ්‍රී ලංකාවේ මාධය දක්වන සහයෝගය ඉතා අල්ප බව පැවසෙනවා.

මේ දෙපලගේ ප්‍රතිපත්ති මාලාව කියැවීමේදී මේ දක්වා සිටි කිසිම දේශපාලයෙකුගේ ප්‍රතිපත්ති වලට ඉඳුරාම වෙනස් බව පෙනෙන අතර මොනම හේතුවකටවත් කිසිවෙකුට ගැත්තන් නොවීම විශේෂ හේතු වකි. ඔවුන් ශ්‍රී ලංකික චන්දදායකයින්ගෙ න් ඉල්ලන එකම ඉල්ලීම නම් ඔවුන්ගේ ප්‍රතිපත්ති මාලාවන් කියවා බලා ඒවායින් ඔබට හා රටට කිසියම් යහපතක් සිදුවේනම් තම තමාගේ නෑදා හිත මිත්‍රාදීන් දැනුවත් කර ඉදිරි ජනාධිපති මැතිවරණයේදී ඔවුන්ට සහාය දක්වන ලෙසය.

නවීන තාක්ෂණය තුලින් youtube සහ facebook මාධ්‍ය වලින් මේ අති උතුම් මිනිසුන් දෙදෙනා ගැන විස්තර සොයා බලන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටින අතර ලබන මැතිවරණ වලදී වෙනදා මෙන් පාට පක්ෂ වලට වහල්වී පාට කන්නාඩි දමා අන්ධානුක රණයෙන් තම වටිනා චන්දය භාවිත නොකර ඔබ ගැන ඔබ උපන් රට ගැන වැඩියමක් කළහැකි මේ දෙපලට සහාය දෙන්න. පසු ගිය 71 වසර තුලදී මෙන් පරම්පරාවට මෙන්ම අනුකම්පාවට නුසුදුස්සන්ට ඔබගේ වටිනා චන්දය නොදෙන්න.

දැනට දේශපාලනයේ සිටින අපරාදකරු වන්ගෙන් අප මව්බිම මේ වතාවේ මුදා නොගත්තොත් ජනවර්ගයක් හැටියට ඉතාම නුදුරු අනාගතයේදී ලෝක ඉතිහාසයේ නැතිවී ගිය ජාතියක් නොවනු ඇතැයි කෙසේ කියම්ද ?




"ගෝඨා හොඳ දේශපාලකයෙක්ද කියා රට තවම දන්නේ නෑ"
**කාවින්ද ජයවර්ධන (පා.ම. එජාප)**

ඒ වුනාට ඉල්ලන අනික් උදවිය හොඳ අය නොවන බව රට දන්නවනෙ
**අබරං**

අපි එජාපයෙන් හොඳ අශ්වයෙක් ජනාධිපති වරණයට දානවා
**කාවින්ද ජයවර්ධන (පා.ම. එජාප)**

ඒක හොඳයි හදිසියේ පැරදුනොත් වේගෙන් පැනලා යන්න පුළුවන්නෙ
**අබරං**

